" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ISO 9001 SLSI System Certified | SLAB Accredited ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන /தொலைபேசி/ Telephone - 011 - 2092599
ෆැක්ස් /பெக்ஸ்/ Fax - 011 - 2092601
ඊ-මේල් /மின்னஞ்சல்/ E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000


මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/FIN-AP/03/FI/01 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } දිනය / திகதி / Date } 2019.09. 05

## මූල්‍ය චක්‍රලේඛ 08/2019

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

## බස්නාහිර පළාතට අවශ්‍ය හදිසි සේවා ඉටුකිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම.

"රජයට අවශ්‍ය හදිසි සේවා ඉටුකිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම්" යන මැයෙන් යුතුව භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිකුත් කර ඇති 2019.07.22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2016(1) හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන 2016.05.24 දිනැතිව නිකුත් කර ඇති මූල්‍ය චක්‍රලේඛ අංක 11/2016 හි 04 වන ඡේදය පහත පරිදි සංශෝධනය කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

02. "මෙවැනි ගෙවීම් දින 90ක් නොයික්මවන්නාවූ කෙටිකාලීන පදනමක් මත ලබා ගත යුතු හදිසි සේවාවන් සඳහා පමණක් සීමා විය යුතු අතර එබඳු සේවාවක් සඳහා බාහිර පුද්ගලයකු/පුද්ගල කණ්ඩායමකට හෝ විශ්‍රාමික රජයේ නිලධාරීන්ට ගෙවිය හැකි උපරිම මුදල රු.150,000/= කි. මේ සඳහා අත්තිකාරම් මුදල් නොගෙවිය යුතු අතර ගෙවීම් සිදු කල යුත්තේ අදාල කාර්යය ඉටු කල පසුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ පෞද්ගලික අනුමැතිය මත වේ."

03. ඉහත සඳහන් කරුණු හැර 2016.05.24 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 11/2016 හි ඇතුලත් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන අතර මෙම චක්‍රලේඛය මඟින් සංශෝධිත විධිවිධාන 2019.07.30 දින සිට ක්‍රියාත්මක වන බව කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.